# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2345/39 – 2023 අගෝස්තු මස 15 වැනි අඟහරුවාදා – 2023.08.15**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/47 (viii).

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) (ආ) වගන්තිය සහ 21(2)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති “ යාන්ඔය රජමහා විහාරය ” යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ “ යාන්ඔය රජමහා විහාර භූමි ප්‍රදේශය ” සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට, විධානය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

1A – G 40133 – 16 (2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**යාන්ඔය රජමහා විහාරය සංයුක්ත වන ප්‍රදේශය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 311, පුල්මුඩේ (අංක 1) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යාන්ඔය ග්‍රාමයේ පිහිටි ඉඩම්වලට සර්වේයර් ජනරාල්වරයාගේ 2019 අගෝස්තු මස 06 දින දරන අංක එෆ්.ටී.පී. 12 (FVP 12) දරන පිඹුර සහ 2019 සැප්තැම්බර් මස 09 දින දරන අංක එෆ්.වී.පී. 30 (FVP 30) දරන පිඹුරට අනුව බෙදී වෙන් වුණ කැබලි අංක 1429 යාන්ඔය ඉඩම (හෙක්ටයාර 127.0841) කැබලි අංක 1139 අලඩිප්පුලව් ඉඩම (හෙක්ටයාර 19.8346), කැබලි අංක 1142 අලඩිප්පුලව් ඉඩම (හෙක්ටයාර 0.3997), කැබලි අංක 1143 අලඩිප්පුලව් ඉඩම සහ විහාරක්කාඩු ඉඩම (හෙක්ටයාර 16.8937) නමැති ඉඩම් වලින් සමන්විත හෙක්ටයාර 164.2121ක විශාලත්වයෙන් යුක්ත පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :-

**කැබලි අංක 1429 - යාන්ඔය ඉඩම**

*උතුරට* : කැබලි අංක 1432;
*නැගෙනහිරට* : කැබලි අංක 1432,1430 පුල්මුඩෙයි (FVP 30) සහ කැබලි අංක 1431;
*දකුණට* : කැබලි අංක 1431 පුල්මුඩෙයි (FVP 30) සහ කැබලි අංක 1432;
*බටහිරට* : කැබලි අංක 1432.

**කැබලි අංක 1139 - අලඩිප්පුලව් ඉඩම**

*උතුරට* : කැබලි අංක 1140, 232, 1138 සහ 231;
*නැගෙනහිරට* : කැබලි අංක 231 සහ 1143;
*දකුණට* : කැබලි අංක 1143 සහ 1144;
*බටහිරට* : කැබලි අංක 1144, 1140 සහ 232.

**කැබලි අංක 1142 - අලඩිප්පුලව් ඉඩම**

*උතුරට* : කැබලි අංක 234 1/2 සහ 1141;
*නැගෙනහිරට* : කැබලි අංක 1141 සහ 1144;
*දකුණට* : කැබලි අංක 1144 සහ 234 1/2;
*බටහිරට* : කැබලි අංක 234 1/2.

**කැබලි අංක 1143 - අලඩිප්පුලව් සහ විහාරක්කාඩු ඉඩම**

*උතුරට* : කැබලි අංක 1139 සහ 231;
*නැගෙනහිරට* : කැබලි අංක 231 සහ 1144;
*දකුණට* : කැබලි අංක 1144;
*බටහිරට* : කැබලි අංක 1144.

EOG 08 – 0160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.